# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/9 - 2019 මැයි මස 21 වැනි අඟහරුවාදා - 2019.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සංචාරක සංවර්ධන, වනජීවි හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සඳහා විෂයයන් හා කාර්යයන් පැවරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි වහාම ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජොන් ඒ. ඊ. අමරතුංග,
සංචාරක සංවර්ධන, වනජීවි හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

2019 අප්‍රේල් මස 29 වැනි දින.

**උපලේඛනය**

**ගරු රංජිත් අලුවිහාරේ, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. අමාත්‍යතුමාගේ උපදෙස් ඇතිව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක සියලුම ක්‍රියාකාරකම් සම්පාදනය, අධීක්ෂණය හා ඇගයීම. | | |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**ගරු රංජිත් අලුවිහාරේ, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 2. දිවයින පුරා පවතින නීත්‍යානුකූල නොවන සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින අවිධිමත් අංශය (උදා - හෝටල්, ආපනශාලා, මාර්ගෝපදේශකයින් සහ සංචාරක ඒජන්තවරු යනාදිය) ලියාපදිංචි කිරීමේ යෝජිත ක්‍රියාවලියේ සාර්ථකත්වය තහවුරුකිරීම හා 2019 දෙසැම්බර් වන විට ඔවුන් විධිමත් අංශ බවට පත් වීම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග අධීක්ෂණය කිරීම. | | |
| 3. දේශීය සංචාරක ක්‍රියාකාරකම් පිළිබඳ සංවර්ධන හා ප්‍රවර්ධන වැඩ සටහන්වල (උදා :- සංචාරක නිකේතන, කලාප, සිදුවීම් ආදී) ප්‍රගතිය නිරීක්ෂණය හා සමාලෝචනය. | | |
| 4. ක්‍රිස්තියානි ආගමික කටයුතුවලට අදාළව ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම. | | |
| 5. සංචාරක හෝටල් හා චාරිකා නියෝජිත ආයතන වර්ගීකරණ වැඩපිළිවෙල අවධාරණය කරමින් සංචාරක හෝටල් සහ සංචාරක නියෝජිත ආයතනවල සංවර්ධනය සහ නියාමනය අධීක්ෂණය කිරීම. | | |
| 6. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්යයන් සමග සමීප සහ ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීම හා එහි ප්‍රගතිය නිරන්තරයෙන් සමාලෝචනය කිරීම, අධීක්ෂණය, ඇගයීම සහ විශේෂයෙන් සියළු සේවා සැපයුම් වෙළඳසැල, ප්‍රමිති හා තත්වසහතික අංශය, පර්යේෂණ අංශය ආදී අංශවල ඵලදායීතාව කාර්යක්ෂමව සහතික කිරීම. | | |
| 7. රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් අමාත්‍යාංශයේ සහ විශේෂයෙන් ඒ යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාළ සියළුම ක්‍රියාකාරකම් සහ කටයුතු පිළිබඳ මනා ලෙස දැනුවත් වීම. | | |
| 8. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග එක්ව ශ්‍රී ලංකා සංචාරක උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2017 - 2020 ඉදිරියට ක්‍රියාත්මක කිරීම. | | |
| 9. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන සංචාරක නිකේතන, සංචාරක කලාප සහ අනෙකුත් සංචාරක ආකර්ෂණයට ලක්වන දේපල වෘත්තීමය වටිනාකමක් සහිතව පවත්වාගෙන යාම පිළිබඳ අධීක්ෂණය. | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**ගරු රංජිත් අලුවිහාරේ, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 10. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණයේදී උද්භිද උද්‍යාන නඩත්තුව හා මල් වගා කර්මාන්තය පිළිබඳව වැඩිදියුණු කිරීම් පිළිබඳ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය අධීක්ෂණය කිරීම.<br>11. වනජීවී සම්පත් සංරක්ෂණය අධීක්ෂණය කිරීම.<br>12. ජාතික සත්වෝද්‍යානය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී භාරය යන ආයතනයන්හි කාර්යයන් හා සමීප හා ඵලදායී සම්බන්ධතාවයන් පවත්වා ගැනීම හා ඒවායේ ප්‍රගතිය සමාලෝචනය කිරීම, අධීක්ෂණය හා ඇගයීම.<br>13. ඉහත සඳහන් දේට අමතරව කලින් කලට අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් සහ කර්තව්‍යයන්. | | |

06 - 30

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.